සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved]

# විශාඛා විද්‍යාලය කොළඹ - 05
# Visakha Vidyalaya , Colombo - 05

විශාඛා විද්‍යාලය කොළඹ 05, විශාඛා විද්‍යාලය කොළඹ 05, Visakha Vidyalaya Colombo 05, Visakha Vidyalaya Colombo – 05

## තුන්වන වාර පරීක්ෂණය - 2023 (2024)
## Third Term Test - 2023 (2024)

| | | |
|---|---|---|
| ගණිතය<br>**Mathematics** | 7 ශ්‍රේණිය<br>**Grade 7** | *පැය දෙකයි වි. 30*<br>*Two hours and 30 min* |

**නම / අංකය ඃ** ..........................................................................................................

### I කොටස

❖ **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.**

1) මෙම රූපයේ සමමිති අක්ෂ ඇඳ පෙන්වන්න.



2) අවයව සඟල වරහනක් තුළ ලිවීමෙන්, A= {15 ත් 40 ත් අතර ප්‍රථමක සංඛ්‍යා } යන කුලකය ලියා දක්වන්න.

3) 30, 45, 60 යන සංඛ්‍යාවල මහා පොදු සාධකය සොයන්න.

4) $5 + 7\,(5 - 2)\ \div 3 - 4$ ප්‍රකාශනය සුළු කරන්න.

5) බැංකු ණයක් ගත් අයෙක්, අවුරුදු 15 ක් තුළ සෑම මසකම සමාන වාරික මුදලක් ගෙවිය යුතුය. ඔහු පළමු වාරිකය ගෙවන්නේ 2019-01-25 දින නම්, අවසාන වාරික මුදල ගෙවන්නේ කවදා ද?

6) $2 \times 3 \times P \times 3 \times q \times p \times 2 \times 3$ යන ප්‍රකාශනය දර්ශක අංකනයෙන් ලියන්න.

7) මෙම රූපයේ,

(i) සමාන්තර රේඛා යුගලයක් .......................................

(ii) පරාවර්ත කෝණයක් ....................................
නම් කරන්න.




8) හිස්තැන සම්පූර්ණ කරන්න.

$(+8) + (-3) + (\underline{\quad\quad}) = (+7)$

9) $8x + 5 = 77$ විසඳන්න.

10) මෙම රූපයේ වර්ගඵලය සොයන්න.




11) $\frac{1}{3} + \frac{2}{5}$ සුළු කරන්න.

12) 54 : 63 : 108 යන අනුපාතය සරලම ආකාරයෙන් දෙන්න.

13) මෙම ඛණ්ඩාංක තලයෙහි A ලක්ෂ්‍යය මගින් දැක්වෙන $x, y$ ඛණ්ඩාංක මාරු කළ විට ලැබෙන ලක්ෂ්‍යය B ලෙස නම් කළහොත්, B හි $x$ හා y ඛණ්ඩාංක මොනවාදැයි ලියන්න.




14) $2\frac{3}{20}$ යන මිශ්‍ර සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස ලියන්න.

15) මුහුණත් 5 ක් සහ ශීර්ෂ 6 ක් ඇති එක්තරා ඝන වස්තුවක් ඔයිලර් සම්බන්ධතාවයට අනුකූල වේ නම්, එහි දාර ගණන සොයන්න.

16) මෙම ටෙසලාකරණය සලකන්න.

(i) මෙය කුමන ආකාරයේ ටෙසලාකරණයක් ද? ................................................

(ii) මෙහි P ලක්ෂ්‍යය වටා කෝණවල එකතුව කීයද? ..........................................




17) අංක 1, 2, 3, 4 ලෙස පැති ලකුණු කළ සවිධි චතුස්තල කැටයක් වරක් උඩ දමා වැටෙන පැත්තෙහි අගය නිරීක්ෂණය කරන ලදී. ලැබිය හැකි ප්‍රතිඵල අනුව, පහත සිදුවීම් කවර ආකාරයේ ඒවාදැයි සඳහන් කරන්න.

(i) ලැබෙන සංඛ්‍යාව 3 වීම .......................................

(ii) ලැබෙන සංඛ්‍යාව 5 ට අඩු වීම .......................................

18) 1:300 පරිමාණයට අඳිනු ලැබූ සෘජුකෝණාස්‍රාකාර ඉඩමක පරිමාණ රූපයෙහි දිග 5cm ක් වේ නම් එම ඉඩමෙහි සැබෑ දිග සොයන්න.

19) සුළු කරන්න. $1.5g + 1.557g$

20) රූපයෙන් දැක්වෙන වෘත්තයෙහි කේන්ද්‍රය O වේ.




මෙහි (i) OC රේඛාවේ දිග කීයද? ......................................

(ii) OBC ත්‍රිකෝණය හඳුන්වන විශේෂ නම ලියන්න. ......................................

## II කොටස

- **ප්‍රශ්න 6 කට පමණක් පිළිතුරු සපයන්න.**

(1) (i) $x$ අක්ෂය දිගේත් y - අක්ෂය දිගේත් O සිට 6 තෙක් වන කාටීසිය ඛණ්ඩාංක තලය අඳින්න. **(ලකුණු 02)**

(ii) පහත දී ඇති ලක්ෂ්‍ය එම කාටීසිය තලය මත ලකුණු කරන්න. **(ලකුණු 04)**

A (1, 1) , B(5, 1) , C (5, 5) , D (1 , 5)

(iii) ඉහත ලකුණු කළ ලක්ෂ්‍ය අනුපිළිවෙළට සරල රේඛා වලින් යා කර සංවෘත රූපයක් ලබා ගන්න. **(ලකුණු 01)**

(iv) එම තල රූපයේ නම ලියන්න. **(ලකුණු 01)**

(v) එම තල රූපයේ සමමිති අක්ෂයක් ඉහත ලබාගත් රූපයේ අඳින්න. **(ලකුණු 01)**

(vi) එම සමමිති අක්ෂය මත පිහිටන ලක්ෂ්‍යයක ඛණ්ඩාංක ලියන්න. **(ලකුණු 01)**

(2) (a) (i) දිනකට සමාන මුදල් ප්‍රමාණයක් බැගින් ඉතිරි කරන සුරංගි, දින 8 ක් තුළ ඉතිරි කළ මුදලට තවත් රු. 66 ක් එකතු කර රු. 450 ක් වටිනා මාලයක් මිලට ගත්තාය. ඇය විසින් දිනකට ඉතිරි කළ මුදල රු. $x$ ලෙස ගෙන සරල සමීකරණයක් ගොඩනගන්න. **(ලකුණු 02)**

(ii) සමීකරණය විසඳා ඇය දිනකට ඉතිරි කළ මුදලෙහි වටිනාකම සොයන්න. **(ලකුණු 02)**

(iii) දී ඇති පංචාස්‍රයේ පරිමිතිය P නම් P, $x$ හා y අතර සම්බන්ධය දැක්වීමට සූත්‍රයක් ගොඩනඟන්න. **(ලකුණු 01)**




(b) වෙළෙන්දෙකු ළඟ රඹුටන් ගෙඩි 250 ක තොගයක් තිබුණු අතර, ඉන් 150 ක් විකුණන ලදී.

(i) විකුණන ලද ප්‍රමාණය මුළු ගෙඩි ගණනින් භාගයක් ලෙස ලියා එය සරලම ආකාරයෙන් දක්වන්න. **(ලකුණු 02)**

(ii) එම භාගය ප්‍රතිශතයක් ලෙස දක්වන්න. **(ලකුණු 02)**

(iii) ඉතිරි වූ ගෙඩි ප්‍රමාණය, මුළු ගෙඩි ප්‍රමාණයෙන් භාගයක් ලෙස දක්වා එය දශම සංඛ්‍යාවක් ලෙස ප්‍රකාශ කරන්න. **(ලකුණු 02)**

(3) එක්තරා කර්මාන්ත ශාලාවක සතියක් තුළ සෙල්ලම් කාර් නිපද වූ ප්‍රමාණ පහත වගුවේ දැක්වේ.

| දිනය | සෙල්ලම් කාර් ගණන |
|---|---|
| සඳුදා | 250 |
| අඟහරුවාදා | 375 |
| බදාදා | 300 |
| බ්‍රහස්පතින්දා | 565 |
| සිකුරාදා | 480 |

(i) ඉහත තොරතුරු තීර ප්‍රස්තාරයක් මගින් දක්වන්න. **(ලකුණු 08)**

(ii) නිපදවන ලද වැඩිම සෙල්ලම් කාර් ගණන හා අඩුම සෙල්ලම් කාර් ගණන අතර වෙනස සොයන්න. **(ලකුණු 02)**

(4) (a)



(i) මෙම පතරම යොදාගනිමින් සෑදිය හැකි ඝන වස්තුවේ නම ලියන්න. **(ලකුණු 01)**

(ii) මෙම පතරමේ දක්නට ලැබෙන මුහුණත්වල හැඩයන් ලියන්න. **(ලකුණු 02)**

(iii) මෙයින් සාදන ඝන වස්තුවේ මුහුණත්, ශීර්ෂ හා දාර ගණන ලියන්න. **(ලකුණු 03)**

(iv) මෙම ඝන වස්තුව ඔයිලර් සම්බන්ධතාවයට අනුකූල බව පෙන්වන්න. **(ලකුණු 03)**

(v) මෙවන් ඝන වස්තු දෙකක සමචතුරස්‍රාකාර මුහුණත් එකිනෙකට සම්පාත වන ලෙස ඇලවීමෙන් ලැබෙන ඝන වස්තුවේ මුහුණත් ගණන සොයන්න. **(ලකුණු 01)**

(5) (a) සුනෙත් හා බිනුකගේ නිවෙස්වල සිට නගරයට ඇති දුර පිළිවෙළින් 750 m හා 2.25km වේ.

(i) දුර ප්‍රමාණ දෙක අතර අනුපාතය සරලම ආකාරයෙන් දක්වන්න. **(ලකුණු 02)**

(ii) 2:5:7 අනුපාතයට තුල්‍ය අනුපාතයක් ලියා දක්වන්න. **(ලකුණු 01)**

(b) (i) සෘජුකෝණාස්‍රයක දිග හා පළල අතර අනුපාතය 3:2 වේ. එහි පරිමිතිය 80cm නම් දිග හා පළල වෙන වෙනම සොයන්න. **(ලකුණු 03)**

(ii) යම්කිසි මුදලක් කැලුම්, වාසනා හා තාරකා අතර බෙදාගනු ලැබුයේ 2:3:5 අනුපාතයටය. වාසනාට වඩා තාරකාට ලැබුණ මුදල රු. 500 නම් ඔවුන් බෙදාගත් මුළු මුදල කොපමණ ද? **(ලකුණු 02)**

(c) විකිණීමට ඇති පලතුරු යුෂ බෝතලයක $120ml$ යුෂ ප්‍රමාණයක් අඩංගු වේ. $1.8l$ පලතුරු යුෂ ප්‍රමාණයකින් එවැනි බෝතල් කීයක් සෑදිය හැකි ද? **(ලකුණු 02)**

(6) 1:1000 පරිමාණයට අඳින ලද සෘජුකෝණාස්‍රාකාර ක්‍රීඩා පිටියක පරිමාණ රූපයක් පහත දැක්වේ. A මගින් පිහිනුම් තටාකයක් B මගින් ක්‍රීඩාගාරයක් දැක්වේ.




(i) ඉහත පරිමාණයේ 1cm කින් දැක්වෙන සැබෑ දිග මීටර්වලින් සොයන්න. **(ලකුණු 02)**

(ii) පිහිනුම් කටාකයේ සැබෑ දිග හා සැබෑ පළල සොයන්න. **(ලකුණු 02)**

(iii) පිහිනුම් තටාකයේ සැබෑ වර්ගඵලය සොයන්න. **(ලකුණු 02)**

(iv) ක්‍රීඩාගාරයෙහි සැබෑ දිග සොයන්න. **(ලකුණු 01)**

(v) ක්‍රීඩා පිටිය වටා කම්බි පොටවල් දෙකකින් යුත් වැටක් ගැසීමට අදහස් කරයි නම් අවශ්‍ය වන කම්බිවල අවම දිග සොයන්න. **(ලකුණු 03)**

---

(7) (i) 4cm වන OA රේඛා ඛණ්ඩය නිර්මාණය කරන්න. **(ලකුණු 01)**

(ii) කේන්ද්‍රය O ලෙස ගෙන අරය 4cm වන වෘත්තය නිර්මාණය කරන්න. **(ලකුණු 01)**

(iii) A සිට සමාන දුරින් වන පරිදි වෘත්තය මත පිළිවෙළින් B, C, D, E, F ලක්ෂ්‍ය ලකුණු කරන්න. **(ලකුණු 02)**

(iv) ABCDEF රූපය සරල රේඛා ඛණ්ඩ මගින් යා කර සම්පූර්ණ කරන්න. **(ලකුණු 01)**

(v) ලැබෙන රූපයේ නම කුමක් ද? **(ලකුණු 01)**

(vi) එහි පරිමිතිය සොයන්න. **(ලකුණු 02)**

(vii) BC සරල රේඛා ඛණ්ඩය එක් පාදයක් ලෙස ගෙන BCX සමපාද ත්‍රිකෝණය නිර්මාණය කරන්න. **(ලකුණු 02)**

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න